සන්නස SANNASA

# ලංකාවට යන එන ගමන් තායිලන්තයේ බැංකොක් වගේ ආසියාවේ නගරයකත් දින කිහිපයක් ගත කරල එන්න තියෙනව නම් ඒ නිවාඩුව තවත් සුන්දර වේවි නේද?




ලංකාවට යන එන ගමන් මේ අත්දැකීමත් ලබන්න.

**ඒ කෙටි නිවාඩුවෙන් උපරිම ඵල නෙලා ගන්නට නම් නගරයේ බොහෝ තැන්වලට පහසුවෙන් ළඟාවිය හැකි ප්‍රදේශයක නවාතැන් ගැනීම ඉතා අත්‍යාවශ්‍ය වෙනවා. Svkvmit හෝ Silom ප්‍රදේශය ඒ සඳහා ඉතාම සුදුසු වන ඇති බව මාගේ විශ්වාසයයි. ඒ වගේම ඔබ නවාතැන් ගන්නා ස්ථානය BTS Stop එකකට ආසන්නයේ පිහිටීමත් වැදගත් කරුණක් වෙනවා.**

## ප්‍රථම දිනය

බැංකොක් කියන්නේ බෞද්ධ ආගමික සිද්ධස්ථාන වලට ප්‍රසිද්ධ නගරයක්. හාරසියයකට අධික බෞද්ධ සිද්ධස්ථාන අතරින් ඉතාමත් ජනප්‍රිය සිද්ධස්ථාන 03 ක් පැහැදිලිව හඳුනාගන්න පුළුවන්. ඔයැ Grand Palce, Wat Phra Kaew Wat pho සහ Wat Arun යන එකිනෙකට යාබදව පිහිටා ඇති මේ සිද්ධස්ථාන බැංකොක් නගරයේ සංචාරකයන් ප්‍රධාන වශයෙන් ගැවසෙන ස්ථාන ලෙස ප්‍රසිද්ධියක් උසුලනවා. මේ ස්ථාන තුනම පැය පහ හයක් වැනි කාලයක් ඇතුළත නරඹා අවසන් කළ හැකිය.

## The Grand Palace

**උදෑසන 8 සිට සවස 3.30 දක්වා විවෘතයි.**

සංචාරකයන් වැඩි ප්‍රමාණයක් මේ ස්ථානයට පැමිණෙන නිසා හැකි තරම් උදෑසනින් Grand Palace වෙත ළඟා වුව හොත් නිරතුරුව තදබදයෙන් යම් තාක් දුරට මිදෙන්නට ඔබට හැකි වේවි.

ඔබ නවාතැන් ගෙන සිටින්නේ Sukhomvit, Sathorn, Silom, Siam, Ploenchit, Phayathai, Victory Monument හෝ අනෙකුත් BTS Skytrain line එකට ආසන්න ප්‍රදේශයට නම් BTS Sky Train එකෙන් Saphan Taksin වෙත පැමිණෙන්න. එම දුම්රිය ස්ථානයට පහළින් ඇති Central Pier වල සිට Ferry එකක් මගින් Chao Phraya ගංගාව තරණය කිරීමෙන් වෙත ළඟා වවීට බොහෝ සංචාරකයන් තෝරා ගන්නේ ඒ ගමනේ ඇති අපූර්වත්වය නිසාමයි. බාත් 15 ක් වැනි සුළු මුදලකට (ඔස්.ඩො. සත 70ක්) තායි වැසියන් ගමන් ගන්නා Ferry එකකට ගොඩ වී Grand Palace වෙත ළඟා වීමට පුළුවන්. සංචාරකයන් සඳහා වෙන්වූ Ferry වල වැඩි පහසුකම් ඇති අතර එවැන්නක් සඳහා වුවත් ඔබට වැය වන්නේ බාත් 70120 ත් අතර මුදලක් (ඔස්ට්‍රේලියා ඩොලර් 36 ත් අතර) පමනයි. Grand Palace යනු තායිලන්තයේ රාජකීය පවුල පුරාණයේ වාසය කළ ස්ථානයයි. එයට යාබදව පිහිටා ඇති Temple of Emerald Buddha සිද්ධස්ථානය තායිලන්තයේ පිහිටි අති උත්තරීතරම බෞද්ධ සිද්ධස්ථානය ලෙස පිළිගනු ලැබෙනවා. එම නිසාම ඒ භූමියට ඇතුළු වීමේදී ඉතා සංවර ඇඳුම් වලින් සැරසීමට අවශ්‍ය බවත් විශේෂයෙන් මතක් කළ යුතුයි. Grand Palace ප්‍රවේශ පත්‍රය ලබාගන්නා ඔබට ලොව විශාලතම තේක්ක දැව වලින් නිර්මාණය වූ ගොඩනැගිල්ල වන Vimanmek Mansion වෙත පිවිසීමටත් අවස්ථාව හිමිවෙනවා.

## Wat Pho

**උදෑසන 8 සිට සවස 3.30 දක්වා විවෘතයි.**

ඔයැ Grand Palace වලට පිටුපසින් පිහිටා ඇති Wat Pho එහි ඇති සැතපෙන බුදු පිළිමය නිසා ප්‍රසිද්ධියක් උසුලනවා. Grand Palace හි සිට විනාඩි 10 ක පමණ දුරින් පිහිටා ඇති Wat Pho වලට ඇතුළුවීමේ ගාස්තුව බාත් 100 ක් (ඔස්ට්‍රේලියානු ඩොලර් 5.50 ක් පමණ) වෙනවා. Wat Pho වැදගත් වෙන්නේ මීටර් 46 ක් දිගැති රන් ආලේපිත සැතපෙන බුදුරුව නිසාම පමනක් නොව ලෝක ප්‍රසිද්ධ තායි සම්භාහන ක්‍රමය බිහි වී ඇත්තෙත් මේ භූමියේ වීම නිසායි. Grand Palace එකට සාපේක්ෂව තදබදය තරමක් අඩු නිසා ඔබට රිසි සේ ඡායාරූප ලබාගැනීමටත් පහසු ස්ථානයක් ලෙස Wat Pho හැඳින්වීමට පුළුවන්. ඒ අවට ඇති වීදි කඩ වලින් තායි සංස්කෘතියට ආවිනික තෑගි භාණ්ඩ වගේම තායි Street Food රස බැලීමටත් ඔබට අවස්ථාව උදා වෙනවා.

## Wat Arun

**උදෑසන 8.30 සිට සවස 5.30 දක්වා විවෘතයි.**

Wat Pho සිට Tha Tien Pier එකට ඇවිද ගොස් බාත් 5 ක් වැනි ඉතාම සුළු මුදලකට ගංගාවේ අනෙක් පසට Ferry එකක් ගැනීමෙන් ඔබට Wat Arun වෙත ළඟා විය හැකිය. Wat Arun හි ඇතුල්වීමේ ගාස්තුව බාත් 100 ක් Khmer ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ඉදිවූ මේ සිද්ධස්ථානය Cone එකක ස්වරූපයක් ගනු ලබනවා. එය මීටර් 80 ක් පමණ උස වන අතර ඔබත් අවදානම් අත්දැකීම් වලට ප්‍රිය කරන්නේ නම් මෙම ගොඩනැගිල්ලේ මුදුනටම නැග Bangton නගරයේ සිරි නැරඹීමටත් හැකිය.

සවස් කාලයේදී රාත්‍රී ආහාරය සඳහා සංචාරකයන් වැඩි වශයෙන් ගැවසෙන The Grand Palace ප්‍රදේශයට නැවතත් ඔබට ළඟා වීමට හැකිය. නොඑසේ නම් Khao San Road ප්‍රදේශය තෝරා ගැනීමටත් පුළුවන්. Khao San Road ප්‍රදේශය ලෝකයේ Backpaners Capital ලෙසින් හැඳින්වෙනවා. තායි Street Food රස විඳීමට ඇති හොඳම ස්ථානයක් ලෙස මේ ප්‍රදේශය ප්‍රසිද්ධයි. Khao San Road ප්‍රදේශය විවෘතව ඇත්තේ අළුයම 2.00 වන තෙක් පමණක් නිසා ඊට වැඩි කාලයක් ගතකිරීමට ඔබ බලා පොරොත්තු වෙනවානම් Soi rambuttri ප්‍රදේශයක් නිර්දේශ කරන්නට පුළුවන්.


The Grand Palace


Wat Pho


Wat Arun